
# පාරිසරික දේශීය දැනුම, ජෛව විවිධත්වය හා ජාතිකත්වය

සිරිලක ජෛව විවිධත්වයෙන් පොහොසත් රටකි. එය විසි ගණනක වන ගෝලිය ජෛව විවිධත්ව උණුසුම් කේන්ද්‍ර ( Global Biodiversity Hotspots ) වලින් එකකි.

දේශිය පාරම්පරික දැනුම සම්භවය වන්නේ විවිධත්වයෙන් යුතු අවකාශය පුද්ගලයා මත ඇති කරන ක්‍රියාවේ ප්‍රතිඵලයක් ලෙසිනි. ජෛව විවිධත්වයෙන් පොහොසත් රටක් අවශ්‍යයෙන්ම දේශිය පාරම්පරික දැනුමෙන් පොහොසත් රටක් නොවේ. ජෛව විවිධත්වය එම දැනුම ඇතිවීම සඳහා එක් පූර්ව අවශ්‍යතාවයක් පමණි. ඉතාමත්ම වැදගත් අත්‍යාවශ්‍ය දෙය නම් මිනිසුන් එනම් පුද්ගල පැවැත්ම විවිධත්වයෙන් යුතු අවකාශය සමඟ පවත්වන සම්බන්ධතාවයයි. සම්බන්ධව පවතිනවා යනු ස්වභාවික පරිසරයේ ඇති ජිවී අජිවී සියල්ල එනම් ගස්වැල්, සතුන්, කුරුල්ලන්, ගංගා, ඇල දොළ, කඳු පර්වත තණ බිම් අප වැනිම අනෙක් මිනිසුන් ආදිය සමඟ සංඥා ඇති වීමයි. හැඟීම් නම් මෙම සංඥා මට්ටම මුහුකුරා ගියවිට ඇතිවන තත්වයයි. කොතරම් විවිධත්වයෙන් යුතු පරිසරයක විසුවද, හැඟීම් සංඥා මට්ටමෙන් සොබාදහමට ප්‍රතිචාරයක් නොදැක්වේ නම් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාව සිදුනොවේ. මෙවිට පුද්ගලයාට අනන්‍ය ප්‍රායෝගික අවබෝධයක් හෝ දැනුමක් ඔහු වෙත උරුම නොවේ. එවිට පාරම්පරිකව කාලයේ ක්‍රියාව ඔස්සේ සම්ප්‍රේෂණය වන්නේ මොනවාද? සොබා දහමේ විවිධත්වයට සංඥා නොමැති විටක මිනිසුන් අතර සොබාවික සම්බන්ධතා ඇතිවේද? ආච්චිලා, සියලාට, මව්පියවරු ඔස්සේ මුනුපුරු මිනිපිරියන්ට යම් පොදු දැනුමක් උරුම වීමට සම්බන්ධතා පැවතිම අනිවාර්යකි. ඔවුන් අතර සම්බන්ධතා නොමැති විටක පාරම්පරිකව යමක් උරුම වීමේ ක්‍රියා මාර්ගයද ඇන හිටියි.



දේශිය පාරම්පරික දැනුම නමින් හැඳින්වෙන්නා වූ දැනුම් සම්භාරය අද දවසේ මුහුණ දෙන අභියෝග හා පෘථිවියේ නිශ්චිත කාලයක වෙසෙන්නා වූ මනුෂ්‍ය වර්ගයා වශයෙන් එය සාර්ථකව ජය ගැනිම සඳහා අප විසින් කුමක් කල යුතුද යන්න සාකච්ඡාවකට බඳුන් කිරිම මේ ලිපියේ අරමුණයි. ලෝකය නමින් අප අත්දකින මේ මහා පැවැත්ම අතිතය වර්තමානය හා අනාගතය ලෙසින් වන කාලයේ විපරිනාමීය ක්‍රියාවලියයි. රටක් වශයෙන් ගතහොත් ඒ ඒ කාලවල අප විවිධ ව්‍යාපෘතින් හි නියැලි සිටියෙමු.

40 දශකයේදී අපි ඉංග්‍රීසින් ගෙන් නිදහස ලබාගතිමු. 50 දශකය ගොවි ජනපද ව්‍යාපාර යන්හි ආරම්භය, නිදහස් අධ්‍යාපනය, කෘෂිකර්මය නඟා සිටුවීම වැනි වැඩ කටයුතු වලට වෙන්විය. 60 දශකයේ පමණ අපි හරිත විප්ලවයේ ජයග්‍රහණයන් ගැන උදම් අනමින් සිටියෙමු. 70 දශකය මුල් භාගයේදී කාර්මිකරණයට හෝ නාගරිකරණයට වැඩි ඉඩක් ලබාදෙමින් විදේශ වෙළඳ පල අරමුණු කරගත් විවෘත වෙළඳපල ආර්ථික ක්‍රමයක් ස්ථාපිත කළෙමු. 80 දශකය නව කාර්මික රටක් වීමටද, 90 දශකය විවෘත ආර්ථිකයට මානුෂික මුහුණුවරක් දී මානව සුබසාධන කටයුතු ක්‍රමවත් කිරීමද අදහස් කරගෙන ක්‍රියාත්මක විමු. ඉහතින් සැකෙවින් දක්වා ඇත්තේ ඒ ඒ කාලවලදී රටක් වශයෙන් අපගේ චර්යාව මෙහෙය වූ වැඩපිළිවෙලයි.

එනම් දේශපාලනය හා ආණ්ඩු කිරීමෙන් මෙහෙයවුණු කාලයේ ක්‍රියාවයි. මෙයට අමතරව තවත් බොහෝ දේ සිදුවිය. එළඹෙන නව සහශ්‍රකයේ සහශ්‍ර සංවර්ධන අභිලාශයන් මුදුන් පමුණුවා ගැනිමේ ක්‍රියාමාර්ගයන් සකසමින් සිටිමු. කාලයේ වේගය එක් දිශාවකට පමණක් ක්‍රියා කරන කිසි දින නොවනවතින්නක් නිසා තව බොහෝ දේ සිදුවීමට නියමිතය. 40 දශකයේ පමණ සිට මේ ලිපියේ ලියැවෙන කාලය දක්වා අපට නිරීක්ෂණය කල හැකි දෙය නම් රටක න්‍යාය පත්‍රය ගෝලිය අවශ්‍යතාවයන්ගෙන් මෙහෙය වන ස්වභාවය කාලයත් සමඟ ක්‍රම ක්‍රමයෙන් වැඩි වී තිබීමයි.

අද දවසේ අප ජෛව විවිධත්ව සංරක්ෂණය කිරීම හා තිරසාර අයුරින් ප්‍රයෝජනයට ගැනීම දේශීය දැනුම තිරසාර සංවර්ධනය සඳහා උපයෝගී කර ගැනීම ආදිය ගැන සාකච්ඡා කරමින් වර්ධනය වන මේ ගෝලීය සංකල්පයන් ක්‍රියාවට නඟා අප රටේ ජනතාවට යහපත් ජන ජීවිතයක් ලබාදීමට ක්‍රියාත්මක වෙමින් සිටිමු. මේ ක්‍රියාකාරකම් තුළදී අප අතින් ක්‍රියාවට නැගෙන්නේ ගෝලීය ප්‍රජාවගේ න්‍යාය පත්‍රය පමණක් නම් අප සිටින්නේ කාලයේ විපරිනාමීය ක්‍රියාවලියට පිටුපසිනි. එවිට කාලයේ සීමිත වූ ප්‍රතිලාභ භුක්තිවිඳීමේ ප්‍රීතිය අත්විඳිය හැකි වුවත් යහපැවැත්ම හා තිරසර සංවර්ධනය අපෙන් ගිලිහී යනු ඇත. මුල් අර්ථයෙන්ම ජාතිය නම් වූ සාරය අප වෙත වෙත් නම්, ආශ්වර්යමත් අකාලික දෙය අප වෙත රැඳෙනු ඇත. ගෝලීය න්‍යාය පත්‍රය තුල වුවත් අපට තෝරාගැනීමට ඉඩක් සොයාගෙන ඒ ඔස්සේ ක්‍රියාත්මක වෙනවා නම් ආශ්වර්යමත් යමක් නිර්මාණය වනු ඇත.

ලෝකයම විශ්ව ගම්මානයක් වී ඇති මේ යුගයේ හුදෙකලාව පැවතිය නොහැකි බවත්, එබැවින් ගෝලීය න්‍යාය පත්‍රයකට අනුව ක්‍රියාත්මක විය යුතු බවත් අප අසා ඇත්තෙමු. සැබැවින්ම විශ්ව ගම්මානයක් කියා යමක් ඇති වී තිබේද? අපට අනුව නම් විශ්ව ගම්මානයක් කියා පෙන්විය හැකි සාරයක් නොමැත. මිනිස් දිවිය නිරස, කරකශ දෙයින් පුරවා ලන කිසියම් විනාශකාරී ක්‍රියාවලියක් සිදුවෙමින් යයි. මේ විනාශකාරී ක්‍රියාවලිය හැඳින්වීමට නොගැලපෙන සිංහල වචනයක් කවුරුන් හෝ අතින් හිතුවක්කාර ලෙස ආදේශ වී ඇත. අපි පුරාණ වැව් ගම්මානයක් ගනිමු. ඔවුන් එකිනෙකා සමඟ නිෂ්පාදන ක්‍රියාවලියෙන් සම්බන්ධවී සිටිති. එහෙත් මේ ඊනියා ගෝලීයකරණයෙන් ගොඩනැගෙන ලෝකයේ මිනිසුන් අතර එවැනි සම්බන්ධතාවයක් තිබේද? අන්තර්ජාලය ආදිය මඟින් ඔවුන් එකිනෙකා සමඟ සම්බන්ද වී ඇතැයි පෙනෙතත් මිනිසුන් එකිනෙකා කෙරෙන් ගව් ගණනක් ඈතින් වෙන්වී සිටිති. වැඩි වී ඇත්තේ ඔවුන්ගේ අන්‍යෝන්‍ය හුදෙකලා බවයි. පරික්ෂාවෙන් අවධානය යොමු කොට සිතා බලතොත් හුදෙකලාව හා තනිකම අනන්තය තෙක් පැතිරී ගොස් ඇති බව ඔබට පසක් වනු ඇත.

අපවෙත දමා ගසන ගෝලීය න්‍යාය පත්‍රයන් අපගේ ජාතික සිතැඟි වලට අනුව හැඩ ගසා ගැනීමක් සිදුවන වාද? වඩා සරලව මෙම ගැටලුව ඉදිරිපත් කරන්නේ නම් ශ්‍රී ලාංකිකයන් වන අපට ජාතික න්‍යාය පත්‍රයක් තිබේද යන ලෙසින් නැගිය හැක. ජාතික න්‍යාය පත්‍රයක් අප වෙත වේ නම් ගෝලීය ප්‍රජාවේ අරමුණු වුවද වඩාත් හොඳින් ඉටුකර දී මනුෂ්‍ය වර්ගයාගේ පැවැත්මට නව ජීවයක් දීමට අපට හැකිවනු ඇත. නිදසුනක් ඇසුරෙන් මෙය තවදුරටත් පැහැදිලි කර ගැනීමට උත්සහ ගනිමු. එතරම් දීර්ඝ ඉතිහාසයක් නොමැති එහෙත් ධනවත් රටක වෛද්‍ය පර්යේෂකයන් පිරිසක් සුව කිරීමට මෙතෙක් ඖෂධයක් සොයානොගත් රෝගයකට ඖෂධයක් සෙවීම සඳහා මිලියන ගණනක් වටිනා මුලූමය හා අනෙකුත් සම්පත් යොදාගන වෙහෙසෙනවා යැයි සිතමු. ඔවුන් ඒ සඳහා ශාක වර්ග ගණනාවක් යොදාගෙන පර්යේෂණ කරනවායැයි සිතමු. එහෙත් දීර්ඝ ඉතිහාසයක් සහිත ලංකාව වැනි රටක මෙම රෝගය සුව කිරීම සඳහා අවශ්‍ය ඖෂධීය රසායන ද්‍රව්‍ය පැලෑටියක ඇතැයි සිතමු.



ඖෂධය සකසා ගන්නා ආකාරයද මුඛ පරම්පරාගත දැනුමක් ලෙසින් ග්‍රාමීය ප්‍රජාව තුල ඇතැයි සිතමු. සම්පත් හුවමාරු ක්‍රමයක් හා ප්‍රතිලාභ බෙදීයන පිළිගත් වැඩපිළිවෙලක් තිබේනම් වෛද්‍ය පර්යේෂකයන්ට එම දැනුම රැගෙන නිරපරාදේ වියදම් වන සම්පත් විශාල ප්‍රමාණයක් ඉතිරි කර ගත හැක. මේ උතුරු දකුණ යාන්ත්‍රය නොමැති විට සිදුවන්නේ ලෝකයේ එක් අන්තයක මිනිසුන් දුප්පත්කමින් බැට කන අතර අනෙක් අන්තයේ නිස්සාරණයේ සම්පත් විනාශ වී යාමයි. අපේ රටද අත්සන් කර ඇති ජෛව විද්‍යාත්මක විවිධත්ව සම්මුතියෙහි මෙවැනි යාන්ත්‍රණ යෝජනා වී ඇත.

එහෙත් ඉතාමත්ම අවාසනාවන්ත අයුරින් අපට පිළිගැනීමට සිදුවී තිබෙන්නේ ජාතික න්‍යාය පත්‍රයක් සැකසීමට ජාතික කියා සාරයක් පවතිද යන්න සැක සහිත බවයි. කිසියම් ජාතික සාරයක් තිබුණු බවට සලකුණක් ඇත. කලකට ඉහතදී ලෝකයටම පොදු තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයක් ලෙසින් සැකසුනු Agenda 21 නම් ලියවිල්ලක් විය. සමහර රාජ්‍යයන් ඒ අනුව යමින් ඔවුන්ගේ රටට අදාලව ගෝලීය

අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනිමට ඔවුන්ගේම Agenda 21 නම් ලියවිල්ලක් සකසා ගත්හ. චීනය මෙවැනි රටකට නිදසුනක් ලෙස දැක්විය හැක. චීනයට චීනය යැයි කිවහැකි ජාතික සාරයක් තිබීම මෙයට හේතුවක් විය. වසර ගණනාවක් තිස්සේ යටත් විජිත හාම්පුත්තුන්ගේ සූරාකෑම් වලින් බැටකන ලැබ, තවමත් ඔවුන්ගේ ජීවමාන අවතාර සමඟ පොර බදන, ඉන්දියන් සාගරයේ කුඩා රටක වැසියන් වන අපට අද ඉතිරිව ඇත්තේ ජීවත්වීමේ මූලිකම අවශ්‍යතා සපුරා ගැනිම සඳහා එකිනෙකා හා තරඟ කරමින් යුදවැදීමයි. තරඟයෙන් දිනන්නේ තරඟයේම නිර්මාණයක් වන පිටස්තර අනිකකු මිස ඔබද මාද නොවේ. අපි පිටස්තර අනිකකු උදෙසා ජීවත් වී ඒ උදෙසාම මිය යන්නෙමු.

අනිකකු උදෙසා ජීවත්වීම දිගින් දිගටම කල හැක්කක් නොවේ. එය කනස්සල්ල දොම්නස හා අතෘප්තිය උපදවයි. අතෘප්තිමත් පුද්ගලභාවය අවතාරයක් ලෙසින් නැගිසිට පුද්ගලයාවම ප්‍රශ්න කරයි. අපට අනුව නම් ශ්‍රී ලාංකික ජාතිය යනු ලක් පොලොවේ අප විසින් සාක්ෂාත් කර ගත යුතු පැවැත්මකි. එය කිසිදිනෙක ලක් පොලොවේ තිබී නොමැත. මේ ජාතිය නම් අප පොදුවේ මහ පොලොවේ නැවුම් සුවඳ තුල සංඥා මට්ටමින් දියවී ගිය කල ඇතිවන සම්බන්ධතාවයයි. ඒ සංඥා මට්ටමට වඩා ප්‍රාථමික වූ මහා පැවැත්මයි. එය ගොඩනැගිය හැකි නොවේ. එයට ඇති බාධාවන් ජයගැනිම පමණි කල හැක්කේ. එවිට

එය ඉබේම ස්වභාවිකව මලක් මෙන් විකසිත වෙයි. ජාතිය පවති නම් දේශීය පාරම්පරික දැනුමට අදට වඩා අර්ථ සම්පන්න බවක් ලැබෙනු ඇත.

එහෙත් එතෙක් අප කුමක් කරමුද? දේශීය දැනුම සාමුහික දැනුමකි. එය කිසියම් ගෝත්‍රයකට, සංස්කෘතියකට සුවිශේෂ ආවේණික බවක් පෙන්වයි.

සොබා දහමේ බාධක අභියෝග ආදියට මුහුණ දෙමින් දිවි ගෙවන සංවේදී මිනිසුන්ගේ අත්දැකීම් පාරම්පරිකව ගලායමින් ඇගැයීම් වලට භාජනය වෙමින් මනුෂ්‍ය වර්ගයාට උරුම වෙයි. සාමුහික දැනුමක් ලෙස දේශීය දැනුම ගොඩනැගිමට අවශ්‍ය මිනිස් පරිසර සම්බන්ධතා මේ යුගයේ ලක් පොලොවේ ඉතා සරලය.

ප්‍රධාන වෙළඳපල සමාජ ප්‍රවාහයට එක්වීමේ හැකියාවක් නොමැති අන්ත දුෂ්කර වන ගත ගම්මානයක එවැනි කිහිප දෙනෙක් සිටිය හැක. නූතන වෙළඳපළ ශිෂ්ඩාචාරයන්ගෙන් අපගමනය වූ ඔවුන් වෙත අත්දැකීම් තිබුනද ඒවා පාරම්පරිකව උරුම වීමක් සිදු නොවන තරම්ය. ඔවුන්ගේ දූවා දරුවන් ගොවිතැන් අතහැර දමා පාරම්පරික දැනුමට පිටුපස හරවා නාගරික ඇඟලුම් කම්හලක හෝ ආරක්ෂක සේවයක රැකියාවට යති. දේශීය දැනුම මේ මොහොතේ තිරසාර සංවර්ධනයේ ලා ක්‍රියාකාරී මෙහෙයක් ඉටු කරන දැනුම් පද්ධතියක් නොවේ. සමහර විට වැඩිහිටි පරම්පරා විසින් සිය පණ මෙන් සුරැකි දේශීය දැනුම අඩංගු පුස්කොල පොත් මිටියක් සංචාරකයන්ට පරණ බඩු එකතු කරන්නෙකුට විකුණා කියක් හෝ සොයාගෙන බඩ වියත රැකගන්නවා විය හැක. විකිණීම හා මිලදී ගැනිම ඒ තරමටම මේ යුගයේ යථාර්ථයක් වී ඇත.

සංරක්ෂණය ගැන අවබෝධයක් ඇත්තකු ස්ථානීය සංවර්ධනය (in situ conservation) යනු කුමක්දැයි දනියි. කිසියම් ජීවී විශේෂයක් එය හමුවන ස්වභාවික පරිසරයේම ගහනය වැඩිකර ගනිමින් වර්ධනය වීමට ඇති බාධා ඉවත් කිරීමෙන් මෙය කල හැකිය. දේශීය දැනුම අරභයා මෙවැනි වැඩ කටයුත්තකට වුව අප පමා වැඩියයි හැඟේ. ගොවිතැන හෝ වෙනත් කිසියම් ශිල්පීය වෘත්තියක යෙදී සිට ජීවිතයේ සැදෑකාලය ගත කරන හෝ මියයන විට සෑම වැඩිහිටියක්ම ඔහු ජීවත්වූ පරිසර පද්ධතිය පිළිබඳ විශේෂඥයෙකි. ඉහතින් දක්වා ඇති අයුරින් දැනුම යනු සංඥා මට්ටමේ හමුවන ගොඩනැංවීමකි. මේ යුගයේ අපගේ අනාගතය වන කුඩා දරුවන්ගේ සංඥා ස්කන්ධයට වැඩි වශයෙන්ම බලපෑම් ඇතිකරනු ලබන්නේ විද්‍යුත් මාධ්‍යයන්ය.

බොහෝ කුඩා දරුවන් කුලැටි අලු කොබෙයියන්ද කලබලකාරී ලෙහෙනුන්ද සුළඟේ රහස් මුමුනන කුඩා වන මල්ද නොදකිති. ඔවුන්ගේ අවධානය එනම් මුලු මහත් සංඥා පද්ධතියම වෙළඳපල සමාජ - ආර්ථික පද්ධතියට උරගානු ලැබ ඇත. දැනට වසර 25 කට 30 කට පමණ පෙර ඇළ දොළ වල වක්කඩවල නල හඳයින්, දණ්ඩි, කොකුන්, කොරවක්කන්, සමඟ ගැවසුන දරුවෝ දක්නට නැත. ඇල ඉවුරේ වැටකේ පඳුරු ගැනද ජල පහරේ රිද්මයට නටන කෙකටිය පඳුරු ගැනද ඔවුන් උගත්තේ එම පරිසරයේම හිඳිමිනි. එය පරිසර පද්ධතිය නම් පරිවාරයේ අර්ථවත් හිඳිමකි. ඔවුන්ගේ සංඥා ස්කන්ධය කොතරම් පොහොසත් වන්නට ඇත්ද? මේ මහා ආශ්චර්යයන් එනම් මහ පොලොවේ ජෛව විවිධත්වයේ සුන්දරත්වය

විදීම ඔවුනට අහිමි කර ඇත. සැබැවින්ම එහි උරුම කරුවෝ ඔවුන්ය. වසර පුරා උණුසුම් සූර්යාලෝකය නොමදව ලැබෙන මෝසම් වර්ෂාවන්ගෙන් වර්ෂාව ලබන නිවර්තන කලාපීය රටක ඉපදීමේ භාග්‍යය ඔවුන්ගෙන් උදුරා ගෙන ඇත. මෙවැනි පසුබිමක් තුල අප හෝ අපගේ අනාගත පරම්පරාවන් ගේ අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම වාගේ භාෂාවෙන් පමණක් ගොඩනැගෙන වියුක්ත යමකට ඌණනය වී ඇත. මෙවැනි පසුබිමක් තුල අප හෝ අපගේ අනාගත පරම්පරාවන් භාෂාව ඉක්මවා පවතින කෙම් ක්‍රම වැනි දේශීය දැනුම් වල සත්‍යය වටහා ගන්නේ කෙසේද?ආලෝකය ලෙසින් කැටි ගැසුනු අඳුර කැලි කපා ලාභයට විකිණීමට ඇති මේ යුගයේ මේ ගැන හැඟීමක් සංවේදී බවක් ඇත්තෙකුට වහා කළ හැකි දෙයක් තිබේ ද? සැබැවින්ම ඇත. එහි පළමු පියවර නම් පුද්ගල ජීවිතයේ සංඥා මට්ටමේ ඇති අවුල වටහා ගැනිමයි. දැන් සියල්ලෙන් වෙන්වීම සඳහා යෙදී ඇති සංඥා සියල්ල හා එක්වීම සඳහා යොදා ගත හැකි මඟක් පැහැදිලි කර ගත හැක. ඒ අවබෝධය ගස්වැල්, සතුන්, කුරුල්ලන්, ඇල දොළ, ගංඟා, කඳු, මනුෂ්‍ය අත්දැකීම් ආදියට විවෘත භාවයක් ලබා දෙනු ඇත. එවිට විවිධත්වයෙන් යුතු මහ පොලොව සමඟ අපගේ සම්බන්ධය නැවත විකසිත වෙයි.



කුඩා දරුවන්ට මග පෙන්විය යුත්තේ, ශිෂ්ඨාචාරයේදී මිනිසා විසින් භාෂාව තුලට ගෙන එනු ලැබූ හා ගෙන ඒමට නොහැකි වූ සියලු දේ අතර ඇති සම්බන්ධතා නිරීක්ෂණය කිරීමයි. ගස්වැල් සතුන් කුරුල්ලන්ට හදවතේ ඉඩක් දීමයි. ඔවුන් හා හැඟීම් මට්ටමින් සම්බන්ධවීමයි. මෙවිට ඉතා ආශ්චර්යමත් යමක් සිදුවේ. ඔබ මා ලෙසින් වෙන්වී ඇති අපගේ පටු වූ කුඩා පැවැත්ම අහෝසි වී යයි. සියල්ලම ඇති එහෙත් මගේ කියා හඳුනාගැනීමට කිසිවක් නොමැති මේ මොහොත පැවැත්මේ යහපතට යෙදෙයි. සැබෑ පරිවාරය වූ පරිසර පද්ධතියේ සැබෑ ඉදීමක් වන්නේ එවිටයි. මේ සඳහා අප පොලොවේ පොළෝගතියද, වතුරෙ දියරමය ගතියද, ගින්නේ ගිනි ගතියද, වායුවෙහි වායු බවද, විනිවිද යා යුතුවෙමු. මේ අපගේ සැබවින්ම පවතින අපුද්ගල පොදු පැවැත්මයි. සැබවින්ම එය පවතින්නේ වුවද අප එයින් වෙන්වී පාර වැරදී බොහෝ දුර ගොස් මං මුලාවී සිටින්නෙමු. ශිෂ්ඨාචාරයේ ක්‍රියාව මගින් අපගේ අපුද්ගල පොදු පැවැත්ම නිර්දය ලෙසින් නොසලකා හැර පසෙකට දමා ඇත.

මේ යුගයේ මෙවැනි සමස්ථ ක්‍රියාවක් අපට අවබෝධ වී අපගේ සැබෑ ස්වරූපය වන පරිවාරයේ සැබෑ ඉදීමක් වැලකී ඇත්තේ මන්ද?

ලිල් රන්දෙණි
පරිසර කළමනාකරණ නිලධාරී